සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
**All Rights Reserved**

# බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**மேல் மாகாண அரசாங்க சேவை ஆணைக்குழு / Provincial Public Service Commission (WP)**

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරී II ශ්‍රේණියේ නිලධාරින් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2022

| පැය දෙකයි | ආයතන සංග්‍රහය හා කාර්ය පරිපාටික රීති | විභාග අංකය | |
|---|---|---|---|

- පිළිතුරු ලිවීමට පෙර ලබා දී ඇති උපදෙස් හොඳින් කියවන්න.
- විභාග අංකය ඉහත කොටුවේ හා පිළිතුරු ලියන සෑම පිටුවකම දෙපසම ඉතා පැහැදිලිව ලියන්න.
- ඔබේ පිළිතුරු පැහැදිලි ලෙස නිල් හෝ කළු පෑනෙන් පමණක් ලියන්න. පැන්සල් භාවිච්චි නොකරන්න.
- ලබාදී ඇති උපදෙස්වලට අනුකූල නොවන පිළිතුරු ඇගයීම් කාර්යය සඳහා යොදා ගනු නොලැබේ.

### I කොටස

**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01.පරිවාස කාලය තුලදී පෞද්ගලික ලිපිගොනුවට එකතු වන ලියවිල්ලක් නම් කරන්න.

..................................................................................................................

02.එකවර අනියම් නිවාඩු කොපමණ ප්‍රමාණයක් උපරිම වශයෙන් ගත හැකිද?

..................................................................................................................

03.ඉකුත් නිවාඩු ලබාගත හැකි කරුණක් වන්නේ

..................................................................................................................

04.ආයතන සංග්‍රහයේ II කාණ්ඩයට අනුව පළමුවන උපලේඛනයට අයත්වන විෂමාචාරයක් නම් කරන්න.

..................................................................................................................

05.දෛනික තැපැල විවෘත කළ යුත්තේ කවුරුන් ඉදිරියේද?

..................................................................................................................

06.රජයේ සේවයේ ස්ථිර තනතුරකට පත්වන අයෙකුට හිමි නිවාඩු දුම්රිය බලපත්‍ර කට්ටල් ගණන කීයද?

..................................................................................................................

07.සියළුම නිලධාරින්ට වැටුප් වර්ධක නියෝගය ලබා දෙන ආකෘතියේ අංකය වනුයේ

..................................................................................................................

www.psc.wp.gov.lk

08.රජයේ කාර්යාල පරිශ්‍රයක් තුළ විෂ මත්ද්‍රව්‍ය පානය කළ අයෙකුට ලබා දෙන බරපතල දඬුවම කුමක්ද?

..........................................................................................

09.රජයේ නිලධාරියෙකුගේ පත්වීම ස්ථිර කරනු ලබන දිනය වන්නේ

..........................................................................................

10.නිලධාරියෙකු විදේශ ගත වීමේදී නිවාඩු ඉල්ලුම් පත්‍රය කොපමණ කාලයකට පෙර අනුමත කරන කාර්යාලයට ලැබිය යුතුද?

..........................................................................................

11.වැටුප් වර්ධකය මත ලබා දිය හැකි සුළු දඬුවම් ගණන කීයද?

..........................................................................................

12.සංයුක්ත දීමනාව ඉල්ලුම් කිරීමට අවම වැඩ කළ යුතු සේවා කාලය පැය කොපමණද?

..........................................................................................

13.ඉකුත් නිවාඩු ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානියෙකුට අනුමැතිය ලබා දිය හැකි උපරිම දින ගණන වන්නේ,

..........................................................................................

14.දින ½ හෙවත් වරුවක නිවාඩුවක් ඉල්ලුම් කරන නිලධාරියෙකු අනිවාර්යයෙන් රාජකාරී කළ යුතු කාලය වන්නේ,

..........................................................................................

15.ලිපිගොනු අපහරණයේදී ගොනු සංරක්ෂණය කිරීමේ කටයුතු සඳහා බලය තිබෙන දෙපාර්තමේන්තුව වන්නේ

..........................................................................................

16.නිවාඩු දුම්රිය ගමන් බලපත්‍ර වලදී "හිමිකම" යන්නට අයත්වන කරුණක් නම් කරන්න.

..........................................................................................

17.විධිමත් විනය පරීක්ෂණය අවසානයේ විනය බලධාරියා විසින් නිකුත් කරන ලියවිල්ල කුමක්ද?

..........................................................................................

18.නිවාඩු දින දුම්රිය බලපත්‍ර සම්බන්ධව "සහෝදරිය" යන පාඨයට ඇතුළත් නොවන අය කවුද?

..........................................................................................

19.සේවා ව්‍යවස්ථාවක ඇතුළත් වන කරුණක් නම් කරන්න.

..........................................................................................

20.විධිමත් විනය පරීක්ෂණයකදී චූදිතයා වෙනුවෙන් පෙනීසිටින නිලධාරියා හඳුන්වන්නේ

..........................................................................................

**(ලකුණු 01 බැගින් මුළු ලකුණු 20)**

www.psc.wp.gov.lk

<u>**II කොටස**</u>

**ප්‍රශ්න <u>හතරකට (04)</u> පමණක් පිළිතුරු සපයන්න.**

01.(i) නිවාඩු විෂයය භාර නිලධාරියාගේ කාර්යභාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) "ඉකුත් නිවාඩු" "අසනීප නිවාඩු" කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

02.(i) පත්වීම් බලධාරියා හා විනය බලධාරියා කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) සුළු දඬුවම් පැනවිය හැකි වරද වර්ග **පහක් (05)** නම් කරන්න. (ලකුණු 10)

03.(i) මහජනතාව වෙත ලිපියක් "ආමන්ත්‍රනය කිරීම" සහ "අවසන් කිරීම" කෙබඳු ආකාරයෙන් කළ යුතුද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) ලිපියකට අත්සන් තබන ආකාරයන් උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10)

04. (i) රජයේ නිලධාරියෙකු උසස්කිරීමකදී අවශ්‍ය ලියකියවිලි මොනවාද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ii) කාර්යක්ෂමතා කඩඉම් විභාග සහන ලබාගත හැකි ආකාරය විස්තර කරන්න. (ලකුණු 10)

05. (i) බස්නාහිර පළාත් සභා විනය කාර්ය පටිපාටියට අනුව නිලධාරියෙකුගේ සාමාන්‍ය විනය යටතට අයත්වන කරුණු **පහ (05)** නම් කරන්න. (ලකුණු 10)

(ii) මත්පැන් හා විෂමත්ද්‍රව්‍ය භාවිතය රජයේ නිලධාරියෙකුට බලපාන ආකාරය විස්තර කරන්න.

(ලකුණු 10)

06. පහත සඳහන් කරුණු **හතරක් (04)** පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i. පරිවාස කාලය
ii. දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර
iii. සංයුක්ත දීමනාව
iv. වැටුප් වර්ධක වාසි
v. ප්‍රසූත නිවාඩු
vi. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ (ලකුණු 04 x05=20)

www.psc.wp.gov.lk